Copyrighted Material

තරුණ රහස් පරීක්ෂකයෝ~03

# ඇඹරුම්හලේ අබිරහස

පරිවර්තනය

නිලේකා ධනංජනී ගුණවර්ධන

MusesBooks

MusesBooks

www.musesbooks.com || Your Online Bookstore

Copyrighted Material

# 01

# නූලෙන් බේරීමක් !

“මේ දවස්වල තාත්තා හොයන අබිරහස මොකක්ද කියලා දන්නවද?” බේපෝර්ට් දුම්රිය නැවතුම්පොළේ වේදිකාව වෙතට ඉතා උනන්දුවෙන් එබෙමින් සිටි සිය සොයුරා දෙස බලමින් ජෝ හාර්ඩි විමසුවේය.

MusesBooks

“තාත්තා ඩෙට්‍රොයිට්වලට දුවපු හැටියට නම්, ඒක හුඟක් වැදගත් පරීක්ෂණයක් වෙන්න ඕනෙ. කොහොමහරි අපිට තව විනාඩි කීපෙකින් හරියටම ඒ ගැන දැනගන්න ලැබෙයි.”

ජෝ සිය අත් ඔර්ලෝසුව දෙස නොඉවසිල්ලෙන් නෙත් හෙළීය. “කෝච්චිය පරක්කුයි.”

සිය පියා බේපෝර්ට් වෙත ළඟා වූ සැණින්, ඔහු කල්තියා ලබාදුන් ඉඟියට අනුව, නවතම අබිරහසක් තමන් වෙනුවෙන් සූදානම් වනු ඇතැයි, තරුණයන් දෙදෙනාගේම සිතේ බලාපොරොත්තුවක් ඉපදී තිබුණි.

හාර්ඩි මහතා එනතුරු මේ දෙසොයුරන් පමණක් නොව, ඔවුන්ගේ හොඳම මිතුරා වූ චෙත් මෝටන්ද මඟ බලා සිටියේය. “ඔයාලගේ තාත්තාගේ පරීක්ෂණ හැම එකක්ම හරිම කුතුහලය ඇති

www.musesbooks.com || Your Online Bookstore

Copyrighted Material


කරවනවා විතරක් නෙවෙයි, බෙල්ල ගහලා යන විදියෙ භයානක ඒවා." රතුවන්, පිරුණු මුහුණැති කොලුවා සිහිපත් කළේය. "මේ වතාවෙ එයාගෙ පරීක්ෂණයට උදව් වෙන්න අවස්ථාවක් ලැබෙයි කියලා ඔයාලා හිතනවද?"

"නැතුව ඉතින්! අපි ඒක තමා මේ බලාගෙන ඉන්නෙ." ජෝ වහා පිළිතුරු දුන්නේය.

"ඇත්තටම, මම උඹලා ගැන දන්න තරමට නම්..." චෙත් කියාගෙන යන්නට විය. "උඹලා දෙන්නා කොහොමත්, මොන විකාර විදියකින් හරි, මොකක්ම හරි අබිරහසකට පැටලෙනවමයි. ඒකෙන් පස්සෙ මමත් ඒකට ගෑවෙනවා. කොහොම කළත් ඕක තමා අන්තිමට වෙන්නෙ. ඊට පස්සෙ ඉතින් මගේ සාමකාමී ගිම්හාන නිවාඩුවට දෙයියන්ගෙම පිහිටයි!"

ස්වභාවයෙන්ම ඕනෑම දෙයක් පහසුවෙන් කිරීමටත්, අනවශ්‍ය අවදානම් ගැනීමෙන් වැළකී සිටීමටත් ප්‍රිය කළ හාදයෙකු වුවද, චෙත් යනු තමාගේ ඕනෑම දුෂ්කර මොහොතකදී ළඟ සිටින මිතුරෙකු බව දන්නා ජෝ සහ ෆ්‍රෑන්ක් පහත් හඬින් සිනාසුණහ.

තද කළු පැහැ කෙස්වැටියක් සහිත, දහඅට හැවිරිදි ෆ්‍රෑන්ක් සහ ඔහුට වඩා වසරකින් බාල, දුඹුරුවන් හිසකේ සහිත, කලබලකාරී තරුණයෙකු වූ ජෝ, රහස් පරීක්ෂකයෙකු වූ සිය පියාගේ පරීක්ෂණවලට නිරන්තරයෙන් සහාය වූහ. තනිව හෝ සිය පියා වූ ෆෙන්ටන් හාඩ්ඩි මහතාගේ උපකාර සහිතව හෝ, අපහසු අබිරහසක් විසඳීම තරම් සතුටක් මෙම තරුණයන්ට නොවූ තරම්.

MusesBooks

විසල් සුසුමක් හෙළූ චෙත්, අසල වූ ගමන් මලු ගෙනයන කුඩා කරත්තයට බර වූවේ, සිය ශරීර ස්කන්ධය තමන්ටම දරාගැනීමට නොහැකි වූ විටෙක මෙනි. "මොනාහරි ගෙනාවා නම් මට කන්නවත් තිබුණා." ඔහුට කියැවිණ. "අපරාදෙ, මට රසකැවිලි මොනාහරි නැත්නම් රටකජු ටිකක් හරි ගේන්න තිබ්බේ."

හාඩ්ඩි සොයුරන් අතර ඉඟියක් හුවමාරු වූවේය. ඔවුන් නිතරම සිය මිතුරාගේ ආහාර රුචිය පිළිබඳව ඔහුට විහිළු කරන්නට පුරුදු වී සිටියෙන්, ජෝට මේ මොහොතේද සිය මුව වසාගෙන සිටින්නට අපහසු සෙයක් දැනුණි.

"මොකක්ද ප්‍රශ්නෙ චෙත්? ඔයා දවල්ට කෑවෙ නැද්ද? නැත්නම් ඔයාට අද කන්න අමතක වුණාවත්ද?"

www.musesbooks.com || Your Online Bookstore

Copyrighted Material


එවැනි දෙයක් සිදුවීමට ඇති හැකියාව කෙතරම් කුඩාදැයි සිතූ ෆ්‍රෑන්ක්ගේ මුහුණට ළෙන්ගතු සිනාවක් නැගුණි. හාර්ඩිවරුන් දෙදෙනා වෙත රැවුමක් හෙළූ චෙත්, ඊළඟ මොහොතේ සිනාවක් නැගුවේය. "හරි, හරි. මං ඇතුළට ගිහින් මැෂින් එකෙන් රසකැවිලි මොනාහරි අරගෙන එන්නම්."

චෙත් දුම්රිය ස්ථානය තුළට ගිය අතර, හාර්ඩි සොයුරන්ගේ දෑස්, තමුන්ට විරුද්ධ පසින් වූ වේදිකාවට මහ හඬ නඟමින් ළඟා වූ, උතුරු දෙසට ගමන් කරන දුම්රිය වෙත නිරායාසයෙන්ම යොමු විය. දුම්රිය රෝද යටින් ගිනි පුපුරු විසි කරවමින්, බලගතු ඩීසල් එන්ජිම නැවතුණු පසු, මගීන් එකා දෙන්නා ඉන් බැසගන්නට විය.

"ඔයා දැක්කද මෙතනින් කෝච්චියට නඟින්න කවුරුවත් හිටියේ නෑ කියලා?" ෆ්‍රෑන්ක් ඇසුවේය.

ඒ මොහොතේම මෙන්, වේගයෙන් තරප්පුව නැග ආ මිනිසෙක් වේදිකාව දිගේ දුම්රියේ පසුපස දෙසට දිවගොස්, ගමන් අරඹා තිබූ දුම්රියේ අවසාන මැදිරියට පැනගන්නට සමත් වූවේය.

"බලනවකෝ එයා පැන්න හැටි! ඒකා නම් වාසනාවන්ත කොල්ලෙක්." වේදිකාවෙන් ඉවතට වේගයෙන් ඇදී යන දුම්රිය දෙස බලාගත්වනම ජෝ කියැවුණි.

"ඒ විතරක් නෙවෙයි, පිස්සු හාදයෙක්! හා, නැද්ද මං අහන්නෙ?" චෙත් පැවසුවේ නැවතත් සොයුරන් හා එක්වෙමිනි. චොක්ලට් බාර් රසකැවිල්ලක් සපමින් සිටි හේ තවදුරටත් කතා කරන්නට වූවේය. "ඔය හාදයම තමා ස්ටේෂන් එක ඇතුළෙදි මාව නවත්තගත්තෙත්. එතන ටිකට් කවුන්ටරේ ලොකු පෝලිමක් තිබ්බ හන්දා, එයාට එතනින් මාරු කරගන්න ගියොත් පරක්කු වෙනවා කියලා ඩොලර් විස්සේ නෝට්ටුවක් මාරු කරන්න තියෙනවද කියලා මගෙන් ඇහුවා. මනුස්සයට කොච්චර හදිසියක් තිබ්බද කියනව නං, මං දීපු සල්ලි ටික උදුරලා වගේ අරන් දොරෙන් එළියට දිව්වේ මිනිහගෙ පස්සෙන් පොලිසිය පන්නගෙන එනවා වගේ!"

"ඒයි, කොල්ලෝ!" ජෝ කෑගැසුවේය. "ඩොලර් විස්සේ නෝට්ටුවක් මාරු කරන්න තරම් සල්ලි තියෙනවා කියන්නේ, ඔයා සෑහෙන පෝසතෙක්නෙ චෙත්."

චෙත්ගේ මුහුණ එක්වරම රතු වූ නමුත්, ඔහු හැකිතාක් නිරහංකාර ස්වරයක් සිය හඬට මුසු කරගන්නට වෑයම් කරමින් පිළිතුරු දෙන්නට විය. "ඇත්තටම කියනවා නම්, මං අතේ සෑහෙන

MusesBooks

Copyrighted Material



ගාණක් තියෙනවා නම් තමයි." හේ කීවේය. "මං හිතන්නේ මං පර්ස් එකේ සල්ලි තියෙනවද කියලා බලනකොට, ඒ හාදයා ඒ බව දැක්කා."

"ඔයා ඔච්චර සල්ලි ගොඩකින් මොනවද කරන්න හිතන් ඉන්නේ?" ෆ්‍රැන්ක් කුතුහලය පිරි හඬින් ඇසුවේය. "ඔයාගෙම කියලා කාසි අච්චු ගහන මැෂිමක්වත් ගන්නද යන්නේ?"

"ඕකනේ ඉතින්. මාව විහිළුවට ගන්න ලෑස්ති වෙන්න එපා ෆ්‍රැන්ක් හාර්ඩි!" චෙත් සිය අමනාපය පළ කරන්නට වූවේය. "ඔයාලට තේරිලා ඇතිනේ, මං මේ මෑතක ඉඳන් වැඩිය සල්ලි වියදම් කළේ නෑ කියලා. ඇත්තම කියනවා නම්, මං අලුත් විද්‍යා උපකරණයක් ගන්න පිස්සුවෙන් වගේ සල්ලි එකතු කරා. ඔයාලගේ තාත්තා ආවට පස්සෙ, මං ඒක ගන්න යනවා."

"මේ පාර ඔයා හොයාගත්ත විනෝදාංශෙ මොකක්ද චෙත්?" ෆ්‍රැන්ක් සිනාසෙමින් ඇසුවේය.

සිය මිතුරාගේ ඕනෑම විනෝදාංශයක් පවතින්නේ කෙටි කලක් පමණක් බව මිතුරෝ දෙදෙනා අත්දැකීමෙන් දැන සිටියහ. සිත්ගන්නාසුලු වෙනත් යමක් දුටු වහා ඔහුගේ උනන්දුව ක්ෂණිකව ඒ වෙත යොමුවන්නේ, පෙර විනෝදාංශයට වූ ඇල්ම මුළුමනින්ම තම සිතින් මකා දමමිනි.

"මේක වෙනස්." චෙත් ඔවුන්ට තේරුම් කරන්නට උත්සාහ කළේය. "මං විශේෂ විද්‍යා උපකරණ තියෙන කඩේට ගිහින්, කාච දෙකක් තියෙන, හොඳම වර්ගයේ අන්වීක්ෂයක් ගන්න හදන්නේ. ඒ විතරක් නෙවෙයි, ඒකටම හරි යන, ප්‍රදීපනකාරකයකුත්[1] ගන්නවා."

"අන්වීක්ෂයක්!" ජෝ කෑගැසිණි. "ඔයා ඒකෙන් මොකක් කරන්නද යන්නෙ? ඉස්කෝලේ විභාග ප්‍රශ්න පත්තරවලට උත්තර හොයන්නද?"

ෆ්‍රැන්ක්ද උස් සිනාවක් නගමින් ජෝ සමග එක් වූ නමුත් චෙත්ට නම් සිය අදහස තුළ කිසිදු හාස්‍යජනක දෙයක් නොපෙනුණි.

"ඔය දෙන්නා ඔහොම පොඩ්ඩක් ඉන්නකෝ!" හේ වේදිකාව මත වූ ගල් කැටයකට කෝපවත් පා පහරක් එල්ල කරමින් මැතිරුවේය. "මම ස්වභාවික විද්‍යාඥයෙක් හරි, නැත්නම් අඩුගාණෙ සත්ත්ව විද්‍යාඥයෙක් හරි වෙන්ඩ තීරණය කරයිද නැද්ද කියලවත් ඔයාලා තවම දන්නෙ නෑ!"

1 Illuminator

MusesBooks
www.musesbooks.com || Your Online Bookstore

Copyrighted Material


"ෂාහ්!" ජෝ කෑගැසුවේය. "මට දැනුත් නිකන් ඔයාගේ නාම පුවරුව මැවිලා පේනවා වගේ. මහා පරිසරවේදී - චෙත් මෝටන්."

"හරි, හරි." චෙත් පරාජය බාරගැනීමට සූදානමක් රහිතව කියන්නට විය. "අඩුම තරමේ මේ මහා ලොකු රහස් පරීක්ෂකයො දෙන්නට එයාලගේ අබිරහස් විසඳන්න හරි මගෙන් උදව් ඕනෙ වෙයිනෙ."

ඔවුන්ගේ සංවාදය අතරමඟ නැවතුණේ ෆ්‍රෑන්ක්ගේ දැනුම්දීම ඇසීමෙනි. "අන්න, තාත්තා එන කෝච්චිය එනවා."

ඩෙට්‍රොයිට් සිට පැමිණි අධිවේගී දුම්රිය වේදිකාවේ නතර කෙරුණු අතර, හාර්ඩි සොයුරන් දෙදෙනා සහ ඔවුන්ගේ මිතුරා, ඉන් බැසගන්නා මගීන් පීරමින්, හාර්ඩි මහතා සිටීදැයි පිරික්සූහ. ඔවුන්ගේ බලාපොරොත්තු බිඳහෙළමින්, හාර්ඩි මහතා මගීන් අතර දක්නට නොවුණි.

"බේපෝර්ට්වලින් බහින වෙන කවුරුත් නැද්ද?" ෆ්‍රෑන්ක් දුම්රිය සහායකයාගෙන් විමසුවේය.

"නෑ මහත්මයා." යනුවෙන් පිළිතුරු දුන් ඔහු, දුම්රිය ඉංජිනේරුවරයාට පිටත්වීම සඳහා සංඥාව ලබා දී නැවතත් මැදිරියට රිංගා ගත්තේය.

දුම්රිය පිටත්ව ගිය පසු ජෝ හඬ අවදි කළේය. "එකත් එකටම තාත්තට අන්තිම මොහොතෙදි කෝච්චිය මඟඇරෙන්න ඇති. අපි ගිහින් ආයේ හතරට තියෙන කෝච්චිය එනකොට ස්ටේෂන් එකට එමු."

"එහෙනම් ඔයාලට මාත් එක්ක ගිහින් මගේ අන්වීක්ෂෙ අරන් එන්න වෙලාව තියෙනවා." චෙත් යෝජනා කළේය.

තරුණයන් තිදෙන, දුම්රිය ස්ථානයේ රථගාල තුළ නවතා තිබූ, 'රජන' යන අන්වර්ථ නාමයෙන් හැඳින්වෙන ජලෝපි රථය වෙත ඇදෙන්නට වූයේ ඒ අනුවය. දීප්තිමත් කහ පැහැයෙන් වර්ණ ගැන්වුණු 'රජන' යනු, වාහන එන්ජින් සකස් කිරීම, චෙත්ගේ විනෝදාංශය වූ එක් සමයක ඔහු විසින් 'වැඩ දමා සකස් කරන ලද' මෝටර් රථයක් වූ අතර, එය බේපෝර්ට් වීදීවල හුරුපුරුදු දසුනක් විය.

"එයාගෙ ඒ හැටි ආටෝපයක් නැති බව නම් හැබෑව. හැබැයි එයා ඕනේ තැනකට 'මෙහෙම කරද්දි' අපිව එක්කන් යයි." චෙත් නිරන්තරයෙන් කියන්නට හුරුව සිටියේ අසුරක්ද ගසමිනි.

MusesBooks
www.musesbooks.com || Your Online Bookstore

Copyrighted Material



"ඔය කාර් සේල්වල තියෙන මොන සෝබන කාර් එකටවත් මං එයාව මාරු කරන්නේ නම් නෑ."

"ගෑස් මීටරේ පෙන්නන විදියට නම් මේකේ තෙල් ටැංකිය හිස්!" ජෝ පැවසුවේ චෙත් සිය මෝටර් රථය නවතා තිබූ තැනින් ඉවතට ගන්නා අතරවාරයේදීය. "අපිට මේකෙන් නගරෙට යන්න පුළුවන් වෙයි කියලා ඔයාට හොඳටම විශ්වාසද?"

චෙත් ඒ පිළිබඳ වගක් නොගෙන පිළිතුරු දුන්නේය. "ඕහ්, ඇත්තටම ටැංකියේ බාගයක් පිරෙන්න තෙල් තියෙනවා. වෙලාවක් ලැබුණම ඔය මීටරේ අලුත්වැඩියා කරන්න ඕනෑ."

හාර්ඩිවරුන් දෙදෙනා පුදුමයට පත් බැල්මක් හුවමාරු කරගත්තේ, නුදුරේදීම චෙත් සිය අන්වීක්ෂය බදාගන්නා බවත්, ඉන්පසු මෝටර් රථය පිළිබඳ ඔහුගේ තැකීමක් නොවන බවත් හොඳින්ම දැන සිටි බැවිනි.

චෙත් එක්වරම වාහන රථගාල වටා මෝටර් රථය වේගයෙන් කරකැවූයෙන්, රළු පොළොවේ වූ කුඩා ගල්කැට එහි රෝද අතර සිරවී, පසුපස රෝද ආවරණවල ගැටීමෙන් විසල් හඬක් නැඟෙන්නට විය.

"ඒයි! මොකද ඔච්චර හදිස්සි?" ජෝ ඇසුවේය. "අපිට එතනට ගිහින් එන්න පැය තුනක්ම තියෙනවනෙ!"

"කවුද කිව්වේ හදිස්සියි කියලා?" චෙත් උද්ධච්ච ස්වරයකින් ඇසුවේය. "මං මේ වේගෙන් යනවා නෙවෙයි. මං මේ බැලුවේ රැජනගේ ඇඳුම් දඬු[2] පොඩ්ඩක් එහෙ මෙහෙ කළ එකෙන් එයාගේ රෝද කැරකෙන එක වෙනස් වෙලා තියෙනවද කියලා..."

"පොඩ්ඩක් එහෙ මෙහෙ කළා!" ජෝ මුහුණ පුළුටු කරගත්තේය. "අපිට 'එක කෑල්ලක් විදිහට' ටවුමට යාගන්න පුළුවන් වෙයිනෙ?"

"හහ්!" චෙත් කෝපයෙන් පිම්බේය. "ඔහෙලා හැබෑටම මෙච්චර දක්ෂ ගරාජ් බාස් කෙනෙක්ව අගය කරන්නෙවත් නැනෙ!"

බේපෝර්ට් නගරයේ වෙළෙඳ ව්‍යාපාර සහිත කොටසට ළඟා වූ පසු, රථවාහන තදබදය අධිකව තිබෙන අයුරු තරුණයන්ගේ නෙත ගැටුණි. වාසනාවකට මෙන්, විද්‍යා උපකරණ සහිත සාප්පුවට ඉදිරිපසින් වූ පාරේ විරුද්ධ පසින් රථගාලක් සොයාගෙන, නිසිපරිදි සිය මෝටර් රථය ගාල් කිරීමට චෙත් සමත් වූවේය.

2 Tie rods

MusesBooks
www.musesbooks.com || Your Online Bookstore

Copyrighted Material


"දැක්කනේ... මං කිව්වේ!" ඔහු පැවසුවේ සිය මෝටර් රථය අගය කරන්නට අමතක නොකරමිනි. "මගේ හිත හොඳ, වයසක රජන! ඕහ් කොල්ලනේ, මගේ අලුත් අන්වීක්ෂෙ අරන්, වැඩ පටන් ගන්නකල් මට ඉවසිල්ලක් නෑ." පිරිස රියෙන් බැස, සාප්පුව දෙසට ඇවිද යන අතරතුර ඔහු කීවේය.

"මැස්සන්ට, කුරුමිණියන්ට දෙයියන්ගෙම පිහිටයි!" ජෝ සිනාසෙමින් කීවේය.

"මං හිතන්නේ, ඊළඟ අවුරුද්දෙ විද්‍යාව පන්තියේදි ඔයාට සෑහෙන පොරක් වෙන්න පුළුවන් වෙයි!" ෆ්‍රෑන්ක් කීවේ, පාර මාරුවීම සඳහා මාර්ග සංඥා කණුවේ වර්ණ වෙනස් වනතුරු සිටින අතරේදීය.

එහි කොළ වර්ණය දිස් වූ වහා, තිදෙන මාර්ගය හරහා අනෙක් පසට ගමන් කරන්නට වූ අතර, ඒ මොහොතේ මාර්ගයේ විරුද්ධ පස සිටි කුඩා කොලුවෙක්, පාපැදියක් පැදගෙන ඔවුන් සිටි දෙසට එමින් සිටියේය.

ඊළඟ මොහොතේදී සිදුවූයේ කිසිවෙකුත් නොසිතූ දෙයකි. රතු එළියද නොතකා, නළාවද මහ හඬින් නාද කරමින් ඔවුන් සිටි දෙසට වේගයෙන් ඇදී ආවේ සෙඩාන් රථයකි. සිදුවිය හැකි අනතුර සැණෙකින් වටහාගත් ෆ්‍රෑන්ක් වහා ක්‍රියාත්මක වී, ජෝ හා චෙත්වද තල්ලු කරමින් ආපස්සට පිනූයෙන්, තිදෙනාම ආරක්ෂා වූහ. එහෙත් ඔවුන්ගේ සිත භීතියෙන් පුරවාලමින්, කුඩා කොලුවා සහිත පාපැදියට මුහුණ ලා සෙඩාන් රථය වේගයෙන් ඉදිරියට ඇදෙමින් තිබිණි.

"ඔන්න බලාගෙන!" හාර්ඩිවරු ඔහුට අනතුරු අඟවමින්, මහ හඬින් කෑගැසූහ.

MusesBooks
www.musesbooks.com || Your Online Bookstore

Copyrighted Material



www.musesbooks.com || Your Online Bookstore